# ගිවිසුම් පත්‍රය

## (කර්තෘ හා ප්‍රකාශක)

....................................................... දරන ලිපිනයේ පදිංචි ............................................... (මින් ඉදිරියට කතුවරයා ලෙස දක්වා ඇති) සහ ඔහුගේ උරුමක්කාරයෝ ද, පොල්මක්කාරයෝ ද, අද්මිනිස්ත්‍රාසිකාරයෝද, පැවරුම්කරුවෝ ද ඇතුළත් ව පළමු පාර්ශවයට බැඳී 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති කොළඹ 07 අංක 21, ඇල්බට් චන්ද්‍රවංකය දරණ ස්ථානයේ පිහිටි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ස්ථාපිත වාපා යුනිවර්සිටි ප්‍රෙස්/ VAPA University Press (මින් ඉදිරියට ප්‍රකාශක වශයෙන් දක්වා ඇති) අය දෙවන පාර්ශවයට ද බැඳී එකී දෙපාර්ශවය අතර වර්ෂ .................... ක් වූ .............. මස ..............වන දින කොළඹ දී ඇතිකර ගනු ලබන ගිවිසුම යි.

ඉහත සඳහන් කර්තෘ තම " ...................... " යන කෘතිය ඉහත සඳහන් ප්‍රකාශක මඟින් මුද්‍රණය කොට ප්‍රකාශයට පත්කිරීමට, නැවත මුද්‍රණය කිරීමට, බෙදා හැරීමට සහ විකිණීමට වසර 05 ක කාලයක් සඳහා පහත කොන්දේසිවලට යටත්ව ප්‍රකාශක වෙත සම්පූර්ණ අයිතිය පැවරීමට අපේක්ෂා කරන බැවින් පහත කොන්දේසිවලට එකඟව මෙම ගිවිසුම දෙපාර්ශවය අත්සන් තබනු ලැබේ.

එකඟතා කොන්දේසි ඃ

1) කෘතියේ පළමු මුද්‍රණය සඳහා අත්පිටපත තෝරාගැනීමෙන් අනතුරු ව පළමු මුද්‍රණය සඳහා පිටපත් ................. ක් මුද්‍රණය කෙරේ. කෘතියේ නැවත මුද්‍රණයන්හි දී මුද්‍රණය කරන පිටපත් සංඛ්‍යාව කෘතියට ඇති ඉල්ලුම මත ප්‍රකාශක විසින් තීරණය කරනු ලැබේ.

2) කෘතියේ විකුණුම් මිලෙන් 15% ක ප්‍රතිශතයක් කර්තෘභාගය වශයෙන් කතුවරයාට ගෙවීමට ප්‍රකාශක එකඟ වෙයි.

3) මෙම ගිවිසුමේ වලංගුකාලය වසර 05 කි. එකී වලංගුකාලය තුළ දී කෘතියේ අඛණ්ඩ ප්‍රකාශන අයිතිය ප්‍රකාශක වෙත ලබාදීමට මෙම ගිවිසුම මඟින් කතුවරයා එකඟතාව පළකරයි. එම කාලය තුළ සහ එයින් පසුව සිදුකෙරෙන සෑම නැවත මුද්‍රණවාරයක දී ම පළමු ව කතුවරයා දැනුම්වත් කිරීමට ප්‍රකාශක කටයුතු කරනු ඇත. කතුවරයා නැවත මුද්‍රණයක් සඳහා අවසර ලබාදුන් පසුව ගිවිසුම්ගතව පුනර්මුද්‍රණයක් සිදු කෙරේ. ඒ කාලය තුළ වෙනත් ප්‍රකාශකයකු මඟින් හෝ අන් අයුරකින් හෝ කෘතිය පළකිරීමෙන් වැළකී සිටීමට කතුවරයා බැඳී සිටියි.

4) කෘතිය මුද්‍රණය කිරීමේ දී එයට අදාළ කඩදාසි, පිටකවරය, චිත්‍ර හා සේයාරූ ඇතුළු මුද්‍රණ නිමාව, කෘතියේ ප්‍රමාණය හා සැලසුම තීරණය කිරීමේ අයිතිය ප්‍රකාශක වෙත පැවරේ. පොත් බෙදාහැරීම, අලෙවිය හා ප්‍රචාරක කටයුතු මෙන් ම පොතේ මිල නියම කිරීම සම්බන්ධ අයිතිය කෘතියේ ප්‍රකාශක සතු වේ.

5) පොතට අදාළ වන ඡායාරූප හා රූප සටහන් අන්තර්ගතයේ කොටසක් වන හෙයින් ඒවා, නිසි ලෙස ලබාදීමට කතුවරයා බැඳී සිටින අතර අදාළ අවසර ලබාගැනීමේ කාර්යය ද කතුවරයා විසින් කළ යුතු ය.

6) මෙම ගිවිසුම වලංගුකාලය තුළ දී අදාළ කෘතිය හෝ එහි කොටසක් සංශෝධන රහිත ව හෝ සහිත ව වෙනත් ප්‍රකාශකයකු මඟින් හෝ කතුවරයා විසින් හෝ වෙන අයකු ලවා හෝ කුමන මාධ්‍යයකින් හෝ වෙනත් මාර්ගයකින් ප්‍රකාශයට පත්කිරීම සම්පූර්ණයෙන් වැළකී සිටීමට කතුවරයා මෙම ගිවිසුම මඟින් බැඳී සිටියි.

7) ප්‍රකාශක විසින් ලබාදෙන නීත්‍යානුකූල ලිඛිත අවසරයකින් තොර ව මෙම ගිවිසුම වලංගුකාලය තුළ දී අදාළ කෘතිය කුමන ආකාරයකින් හෝ කතුවරයා විසින් හෝ අන්අයකු ලවා හෝ පළකරවීම මෙම ගිවිසුම සපුරා උල්ලංඝනය කිරීමක් වේ.

8) අදාළ කෘතියේ ඇතුළත් තොරතුරු යාවත්කාලීන කිරීම, නව සංස්කරණයක් සිදුකිරීම, ආදී කෘතියේ සංවර්ධන කාර්යයන් සිදුකිරීමට කතුවරයා බැඳී සිටියි.

9) පළමු මුද්‍රණයෙන් කර්තෘ තිළිණ පිටපත් වශයෙන් සියයට එකක හිමිකමක් පිරිනැමෙයි. දෙවන හා තෙවන වශයෙන් මුද්‍රණද්වාර නිකුත් වන්නේ නම් කර්තෘ තිළිණ පිටපත් පහක් පිරිනැමෙයි.

10) කෘතියේ ප්‍රචාරයන් උදෙසා ජනමාධ්‍ය ආයතන සඳහා පිටපත් නිකුත් කිරීමේ වගකීම ප්‍රකාශක වෙත පැවරේ.

11) කෘතිය ප්‍රකාශනයේ දී අනුගමනය කරන පොත් එළිදැක්වීමේ අවස්ථාව සඳහා කතුවරයාට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ශාලා පහසුකම් සැපයීම විශ්වවිද්‍යාලය තුළ පවත්නා ශාලා සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවලට යටත්ව සිදු කෙරේ.

12) කර්තෘ තිළිණ පිටපත් නොමිලයේ සැපයෙන අතර වැඩිමනත් පිටපත් කතුවරයාට අවශ්‍ය නම් කතුවරයා සඳහා 40%ක මුදල් වට්ටමකට මුදල් ගෙවා අවශ්‍ය පිටපත් ලබාගැනීමට කතුවරයාට හැකි ය.

13) කතුවරයා සතු මුල්‍යයමය කර්තෘභාග හිමිකම මස 6 කට වරක් පොත් අලෙවි වී ඇති ප්‍රමාණය අනුව ලබාදීමට ප්‍රකාශන ආයතනය කටයුතු කරනු ඇත.

14) යම් හෙයකින් කෙටිකාලයක දී පොත් සියල්ල අලෙවි නම් සම්පූර්ණ කර්තෘභාග හිමිකම නොපමාව කතුවරයාට ලබාදෙයි.

15) ගිවිසුම්ගත කාලය ඉකුත්වීමෙන් අනතුරු ව පොත් නොවිකිණී තිබේ නම් ඒ බව කතුවරයා දැනුම්වත් කිරීමෙන් පසු වට්ටම් මිලකට පොත් අලෙවි කිරීමේ අයිතිය ප්‍රකාශක සතු ය. එවිට මුද්‍රණ වියදම පියවේ නම් පමණක්, කතුවරයාට කර්තෘභාග ගෙවීමක් සිදු වේ.

16) පරිවර්තන කෘති පළ කිරීමේ දී මුල් ප්‍රකාශක සමඟ සාකච්ඡා කර පරිවර්තන ගාස්තු ගෙවීමට සිදුවේ නම් ඒ හා බැඳුණු නෛතික ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු සියලු ක්‍රියාමාර්ග ගිවිසුම් අත්සන් කිරීමට පෙර දෙපාර්ශවය අතර ලිඛිත අවබෝධතාවකින් යුක්ත ව සිදුකිරීමට බැඳී සිටියි. ක්‍රියාවලිය සඳහා අදාළ පිරිවැය දැරීම ප්‍රකාශන ආයතනයට පැවරේ.

17) කෘතියේ ප්‍රකාශන හිමිකම පමණක් ප්‍රකාශන ආයතනය සතුවේ. කර්තෘ අයිතිය, පසු උරුම අයිතිය හා සම්මාන උළෙලවල් හෝ වෙනත් ඇගැයීම්වල දී කෘතියට හිමිවන ජයග්‍රහණ සඳහා තිළිණ හා මුල්‍ය ලාභ හිමිකම කතුවරයා සතු වේ.

18) මුද්‍රණය කිරීමෙන් පසු ව වෙනත් කලා නිර්මාණයන් පිණිස අදාළ කෘතිය උපයෝගී කරගන්නේ නම්, එහි හිමිකාරිත්වය කර්තෘ සතු ය. එහෙත් මුද්‍රිත කෘතිය හෝ එහි කොටසක් හෝ ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් එවැනි මාධ්‍යයක සහමුලින් ම හෝ කොටස් වශයෙන් ගබඩාකර තැබීම හෝ මුල්‍යමය හිමිකම් ලබාගන්නේ නම් ප්‍රකාශන පාර්ශවය දැනුම්වත් කර සිදු කළ යුතු ය.

19) ප්‍රකාශකගේ ලිඛිත අනුමැතියකින් තොරව ඉහත කෘතිය හෝ ඊට සමාන කෘතියක් හෝ එම කෘතියේම අන්තර්ගතය මුලුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ වෙනත් නමකින් වෙනත් ප්‍රකාශකයකු වෙත ලබාදීම හෝ තමා ම මුද්‍රණය කර ප්‍රකාශයට පත්කිරීම හෝ මෙම කෘතිය පළ වූ දින සිට වසර 05ක කාලයක් තුළ කර්තෘට සපුරා තහනම් වේ.

20) මෙය කතුවරයාගේ ම සාහිත්‍යමය නිර්මාණයක්, පරිවර්තනයක්, ශාස්ත්‍රීය, පර්යේෂණ හෝ අධ්‍යාපන කෘතියක් වන බවත්, මේ කෘතියේ සමස්ත අන්තර්ගතය මඟින් හෝ අන්තර්ගතයේ කොටසක් මගින් හෝ කෘතිය තුළ සාකච්ඡා කෙරෙන යම් සිද්ධියක් නැතිනම් සිද්ධිදාමයක් හෝ කෘතියේ නිරූපිත චරිතයක් හෝ චරිතයක් මඟින් හෝ දැනට ජීවතුන් අතර සිටින හෝ ජීවතුන් අතර නොමැති චරිතයක් හෝ පුද්ගලයෙකුට අපහාසාත්මක හෝ නින්දාසහගත වන ලෙසින් හෝ චරිත ඝාතනයකට තුඩුදෙන හෝ කීර්තියට කැළලක් හෝ සමාජීය ජීවිතයට

අවමානයක් වන කිසිවක් විවේචනාත්මක හෝ අන්‍යුරින් ප්‍රකාශයට පත්කර හෝ නිරූපණය කර නොමැති බවත්, බුද්ධිමය දේපළ නීතිය යටතේ වරදකට තුඩුදෙන කිසිවක්, හෝ ලංකාවේ වර්තමානයේ පවත්නා කවර හෝ නීතියක් යටතේ දක්වා ඇති නීතිරීති, රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයේ කිසිවක් කෘතියේ අඩංගු නොවෙන බවත් කතුවරයා සහතික කර ප්‍රකාශකර සිටියි. තවද මෙම කෘතිය කිසිඳු ආකාරයකින් ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිරීති උල්ලංඝනය කර නොමැති බවද කර්තෘ තහවුරු කර සිටියි. ප්‍රකාශක ඉහත කරුණු සම්බන්ධයෙන් කිසිඳු බැඳීමකට හෝ වගකීමකට පත් නොවන අතර, එහි පූර්ණවගකීම සහ බැඳීම් කතුවරයා බාර ගනියි.

මේ අනුව ඉහත කී එකඟතා ගිවිසිලි සහ කොන්දේසිවලට එකඟ වී ...................................................................................................... හා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය වාපා යුනිවර්සිටි ප්‍රෙස් වෙනුවෙන් බලයලත් විශ්වවිද්‍යාලයේ නියෝජිත 2021......................................... වැනි දින මේ ගිවිසුමට සහ පිටපතට අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| කර්තෘ............................................ | ...................................... | ...................................... |
| (ජා.හැ.අ.......................................) | ප්‍රකාශක (වෙනුවෙන්)<br>උපකුලපති<br>(ජා.හැ.අ.................................) | ප්‍රකාශක (වෙනුවෙන්)<br>ලේඛකාධිකාරී<br>(ජා.හැ.අ....................................) |

| | |
|---|---|
| සාක්ෂිකරු......................................................... | සාක්ෂිකරු......................................................... |
| (ජා.හැ.අ...............................................................) | (ජා.හැ.අ...............................................................) |